# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපායස , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 1190/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 19/07/2024 පැය 1420

## මාධ්‍ය නිවේදනය

### පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු

**01.** **2024.07.18 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 522 | - | තඹ දඟර 03<br>ප්ලාස්ටික් බූලි 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුර.**

2024.07.18 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා සියඹලාණ්ඩුව කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් සියඹලාණ්ඩුව පොලිස් වසමේ දොමෝදර ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සියඹලාණ්ඩුව පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.
**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 41 ක් වූ සියඹලාණ්ඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** සියඹලාණ්ඩුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුර.**

2024.07.18 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා තංගල්ල කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වීරකැටිය පොලිස් වසමේ පාලංකඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන වීරකැටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 74 ක් වූ** පාලංකඩ **ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වීරකැටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**